# ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ශේෂය 2005 වර්ෂයේදී රු.මිලියන 2,309.3 සිට සමාලෝචිත වර්ෂයේදී රු.44,154.2 ක සෘණ ශේෂයක් දක්වා පහත දැක්වෙන පරිදි අඩුවී තිබුණි. මූල්‍ය ප්‍රකාශන වල සටහන් අනුව , 2010 අගෝස්තු අවසානය වන විට සියළුම අරමුදල් අවසාන වී තිබුණු අතර, ඉන් පසු මණ්ඩලයේ වෙනත් අරමුදල් වලින් කෙටි කාලීන ණය ලබා ගනිමින් මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකර තිබුණි. එබැවින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අනාගත පැවැත්ම සම්පූර්ණයෙන්ම රජයේ ප්‍රදාන මත රඳා පවතී.

| වර්ෂය | යෝජනා ක්‍රමයේ ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 2005 | 2,309.3 |
| 2006 | 2,003.7 |
| 2007 | 1,639.8 |
| 2008 | 1,404.8 |
| 2009 | 663.8 |
| 2010 | (40,536.7) |
| 2011 | (44,154.2) |

### 1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලවීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව පාර්තෝෂික සූත්‍ර ක්‍රමය යොදා ගනිමින් පශ්චාත් - රැකියා ප්‍රතිලාභ වගකීම් ගණනය කළ යුතුය. කෙසේ වුවද ඉහත අවශ්‍යතාවයට අනුකූලව පාර්තෝෂික වගකීම් ගණනය කර නොතිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

1992 වර්ෂයේ සිට උපලබ්ධි නොවූ ලෙස පැවති බැංකු ගිණුම් තුනක තැන්පත් කරන ලද රු.1,179,624 ක් වූ උපලබ්ධි නොවූ චෙක්පත් 117 ක වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 4 කට වැඩි කාලයක් හිඟ හිට පැවති එකතුව රු.125,079,264 ක් වූ හිඟ ශේෂ අයකර ගැනීමට ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දැක්වෙන රු.9,335,445 ක් වූ ලැබිය යුතු මුළු ගිණුම් ශේෂ එකතුවෙන් රු.3,538,729 ක් එනම් 38% ක් පමණක් අදාල පාර්ශ්වයන් විසින් සනාථ කර තිබුණි.

(ඇ) එකතුව රු.2,082,031 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු දීර්ඝ කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

(ඈ) යෝජනා ක්‍රමය එහි සියළුම මුදල් වැයකර අවසන් වීම හේතුවෙන් , ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් රු.518,000,000 ක හා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් රු.149,030,442 ක කෙටි කාලීන ණය ලබා ගනිමින් මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකර තිබුණි. ඉහත ණය සම්බන්ධයෙන් කිසිදු නිරවුල් කිරීමක් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර නොතිබුණි.

### 1.2.5 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

යෝජනා ක්‍රමය සඳහා නව මෘදුකාංගයක් සකස් කිරීම සඳහා රජයේ ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසැලට රු.1,475,000 ක මුදලක් ගෙවා තිබුණි.

### 1.2.6 මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 සැප්තැම්බර් 26 දිනැති අංක එම්ඊඑස්/සීඑම්/2006 / 18 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව මාවිල් ආරු සොරොව්ව වසා දැමීම හේතුවෙන් එහි බලපෑමට ලක් වූ ගොවීන්ට ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙන් වන්දි ගෙවීම සඳහා රු.මිලියන 176 ක මුදලක් වෙන් කිරීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද මෙම කාර්යය සඳහා රු.194,169,155 ක් වූ ආයෝජන වට්ටම් කර වන්දි ලෙස රු.120,198,639 ක මුදලක් ගෙවා තිබුණු අතර එය භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස අඛණ්ඩව දක්වා තිබුණි.

(ආ) 2008 වර්ෂයේදී ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ රු.2,791,679 ක් වටිනාකම වූ චෙක්පත් 48 ක් හා රු.7,152,249 ක් වූ බැංකු අණකර මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් 2 දෙනෙකු හා එක් සහකාර අධ්‍යක්ෂවරයකු විසින් වංචා කර තිබුණි. මේ සම්බන්ධයෙන් මහාධිකරණයේ නඩුවක් ගොනුකර ඇති බව මණ්ඩලය විසින් මා වෙත දන්වා තිබුණි.

(ඇ) රු.369,590 ක් වූ විශ්‍රාම මුදල් වංචා කරන ලද ක්ෂේත්‍ර නිලධාරියකුට විරුද්ධව ගොනු කර ඇති නඩුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම නිලධාරියා සේවයෙන් පහකර තිබුණි. කෙසේ වුවද ඔහුගෙන් රු.100,000 ක මුදලක් පමණක් ලැබී තිබුණු අතර නඩුව අවසන් කර තිබුණි. එබැවින් රු.269,590 ක ශේෂය අයකර ගත නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු.3,617,570,558 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,921,267,739 ක් වුයෙන් රු.303,697,181 කින් එනම් 4.74% කින් ඌනතාවයේ අඩුවීමක් දැක්වුණි.

## 2.2 මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වය පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනය

(අ) පරිපාලන වියදම් වලින් කොටසක් රජයේ ප්‍රදාන වලින් දරා තිබුණද , යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය තවදුරටත් අවදානම් තත්ත්වයක විය. යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රතිඵලය පහත දැක්වෙන පරිදි 2007 වර්ෂය අවසානයේ වූ රු.මිලියන 364 ක ඌනතාවය 2011 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,617 ක ඌනතාවයක් දක්වා පිරිහී තිබුණි. එබැවින් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පැවැත්ම පිළිබඳ බරපතල අවිනිශ්චිතතාවයක් පවතී. ඉකුත් වර්ෂ පහක මූල්‍ය ප්‍රතිඵල පහත දැක්වේ.

| | 2011 | 2010 | 2009 | 2008 | 2007 |
|---|---|---|---|---|---|
| | රු.(000) | රු.(000) | රු.(000) | රු.(000) | රු.(000) |
| මුළු ආදායම | 115,434 | 170,898 | 306,607 | 431,209 | 501,983 |
| මුළු වියදම | (1,402,379) | (1,195,110) | (1,103,779) | (951,623) | (891,660) |
| විශ්‍රාම වැටුප් වගකීම වැඩිවීම | (3,059,459) | (2,938,033) | - | - | - |
| ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) | (4,346,404) | (3,962,245) | (797,172) | (520,414) | (389,677) |
| රජයේ ප්‍රදාන | 727,605 | 39,500 | 55,860 | 285,000 | 25,603 |
| රජයේ ප්‍රදාන ක්‍රම ක්ෂය | 1,228 | 1,477 | - | - | - |
| රජයේ ප්‍රදාන වලින් පසු ශුද්ධ අතිරික්තය / ( ඌනතාවය ) | (3,617,571) | (3,921,268) | (741,312) | (235,414) | (364,074) |

(i) 2007 සිට 2011 කාල පරිච්ඡේදය තුළ ආදායම 77% කින් ක්‍රම ක්‍රමයෙන් අඩුවී තිබුණු අතර එම කාල පරිච්ඡේදය තුළ මුළු වියදම 57% කින් වැඩිවී තිබුණි.

(ii) විශ්‍රාම වැටුප් බැරකම හා වියදම වැඩිවීම හේතුවෙන් 2007 සිට 2011 කාල පරිච්ඡේදය තුළදී රජයේ ප්‍රදානයට පෙර ශුද්ධ අතිරික්තය සීඝ්‍ර ලෙස අඩුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 තළදී යෝජනා ක්‍රමය සඳහා ගොවීන්ගෙන් එකතු කර ගන්නා ලද මුළු දායකයන් හා විශ්‍රාම වැටුප් ගෙවීම් පහත දැක්වේ.

| වර්ෂය | දායකය | විශ්‍රාම වැටුප් ගෙවීම |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| 2007 | 222.6 | 685.7 |
| 2008 | 163.1 | 809.1 |
| 2009 | 148.7 | 955.6 |
| 2010 | 136.7 | 1,044.7 |
| 2011 | 97.6 | 1,226.7 |

(ඈ) පහත දැක්වෙන පරිදි 2006 වර්ෂයේ සිට ආයෝජන සීඝ්‍රයෙන් අඩුවී තිබුණු අතර 2011 වර්ෂයේදී ආයෝජන වලින් ලද ආදායමද සඝ්‍ර අඩුවීමක් වාර්තා කර තිබුණි.

| වර්ෂය | ආයෝජන | පොලී ආදායම |
|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන |
| 2006 | 1,985.3 | 264.4 |
| 2007 | 1,656.0 | 251.3 |
| 2008 | 1,256.1 | 243.9 |
| 2009 | 582.2 | 138.9 |
| 2010 | 3.5 | 14.9 |
| 2011 | 30.7 | 1.6 |

ඉහත තොරතුරු වලට අනුව , ආයෝජන 2006 වර්ෂයේ රු.මිලියන 1,985.3 සිට 2011 වර්ෂයේ රු.මිලියන 30.7 එනම් 98.5% ක් දක්වා අඩුවී තිබුණු අතර පොලී ආදායම 2006 වර්ෂයේ රු.මිලියන 264.4 සිට 2011 වර්ෂයේ රු.මිලියන 1.6 එනම් 99.4% ක් දක්වා අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා 2011 වර්ෂයේ ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) රු.11,385,125 ක් වූ දෙවන හා ර්ලඟ වාරික සමාලෝචිත වර්ෂය තුළදී එකතු කර ගෙන තිබුණි.

(ඇ) යෝජනා ක්‍රමයට සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ගොවියෙකු බැඳී නොතිබුණි.

(ඈ) සාමාජකත්වය අහිමි කර තිබුණු දායකයින් 615 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළදී රු.5,994,479 ක මුදලක් ගෙවා තිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

**--------------------------**

සමාලෝචිත වර්ෂයේ සමීක්ෂණ මණ්ඩලය මගින් වාර්තා කරන ලද රු.173,789 ක් වටිනා භාවිතා කළ නොහැකි තොග සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**3.3 ව්‍යාපෘති ප්‍රමාදයන්**

**---------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෝජනා ක්‍රමයේ දායකයන්ගේ පෞද්ගලික ගිණුම් පරිගණක ගත කිරීම සඳහා 1987 වර්ෂයේ සිට රු.මිලියන 21.5 ක මුදලක් ගෙවා තිබුණද , වර්ෂ 24 ක් ගත වීමෙන් පසුවත් , ගිණුම් පරිගණක ගත කර නොතිබුණු අතර 2011 දෙසැම්බර් 31 වන විටත් යාවත්කාලීන කර නොතිබුණි. ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවීම සඳහා දායකයින් සුදුසු බවට පත්වීම තීරණය කිරීමට ප්‍රමාණවත් තොරතුරු යෝජනා ක්‍රමය සතු නොවීය. දායකයන්ගේ ගිණුම් දිස්ත්‍රික් කාර්යාල මගින්ද යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා නව පරිගණක පද්ධතියක් සංවර්ධනය කිරීමට 2008 වර්ෂයේදී කොළඹ විශ්ව විද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඒ මත දරන ලද වියදම රු.5,479,120 ක් විය. ගිවිසුමට අනුව ව්‍යාපෘතිය මාස 6 ක් ඇතුළත නිම කළ යුතු වුවද එය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

**-------------------**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය

(ආ) මූල්‍ය කළමනාකරණය

(ඇ) විශ්‍රාම වැටුප් ගෙවීම හා නොගෙවන ලද විශ්‍රාම වැටුප්